සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

| | | |
|---|---|---|
| ඉතිහාසය | II | (I කොටස) |
| வரலாறு | II | (பகுதி I) |
| History | II | (Part I) |

**25-C** **S** **II**

**2018.08.23 / 0830 - 1140**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

විභාග අංකය: ..................................

**උපදෙස්:**

※ මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
※ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
※ මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නොගැළපේ.** එම **නොගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) ඇපලාචියන් (2) පිරනීස් (3) ඇල්ප්ස්
(4) ඇපිනයින් (5) කාර්පේතියන් (......)

**2.** (1) ස්ෆෝර්සා (2) මෙඩිචි (3) එස්තෙ
(4) ගොන්සාගා (5) ලැන්කැස්ට්‍රියන් (......)

**3.** (1) මැකියාවෙලි (2) ජීන් බොඩෑන් (3) රිචලිව්
(4) තොමස් හොබ්ස් (5) හියුගෝ ග්‍රෝෂියස් (......)

**4.** (1) ජෝන් කැබෝ (2) ප්‍රෙස්ටර් ජෝන් (3) ජොලියට්
(4) ලා සලේ (5) මාක්වෙටේ (......)

**5.** (1) ඩූප්ලේ (2) රොබට් ක්ලයිව් (3) වෙලෙස්ලි
(4) මින්ටෝ (5) වොරන් හේස්ටිංස් (......)

**6.** (1) බොස්ටන් ඝාතනය (2) බොස්ටන් තේ සාදය
(3) බැස්ටීලය බිඳ හෙළීම (4) පිලඩෙල්ෆියාවේ මහාද්වීපික කොංග්‍රසය
(5) 1776 ස්වාධීනතා ප්‍රකාශනය (......)

**7.** (1) සුන් යත් සෙන් (2) චියැං කායි ෂෙක් (3) චෞ එන් ලායි
(4) ඩින් ඩියම් (5) ඩෙං ෂියාඕපිං (......)

**8.** (1) හැරී ට්‍රූමන් (2) අයිසන්හවර් (3) ජෝන් එෆ්. කෙනඩි
(4) රිචඩ් නික්සන් (5) මාටින් ලූතර් කිං (......)

[දෙවැනි පිටුව බලන්න.

**9.** (1) ජවහර්ලාල් නේරු (2) මොහොමඩ් අලි ජින්නා (3) ලාල් බහදූර් ශාස්ත්‍රී
(4) මොරාජි දේසායි (5) රජීව් ගාන්ධි (……)

**10.** (1) එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO)
(2) අරාබි ලීගය
(3) පෙට්‍රෝලියම් අපනයනය කරන රටවල සංවිධානය (OPEC)
(4) යුරෝපීය ආර්ථික ප්‍රජාව (EEC)
(5) අග්නිදිග ආසියාතික ජාතීන්ගේ සංගමය (ASEAN) (……)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) බුද්ධාගම - තායිලන්තය
(2) හින්දු ආගම - බුරුමය
(3) යුදෙව් ආගම - ඊශ්‍රායලය
(4) කතෝලික ආගම - පිලිපීන දූපත්
(5) ඉස්ලාම් ආගම - පාකිස්ථානය (……)

**12.** (1) යුප්‍රටීස්-ටයිග්‍රිස් - ඉරානය
(2) සින්දු - පාකිස්ථානය
(3) හ්වැංහෝ - චීනය
(4) ඉරවඩී - බුරුමය
(5) තේම්ස් - එංගලන්තය (……)

**13.** (1) වස්කෝ ද ගාමා - කැලිකට් වෙත යාත්‍රා කිරීම
(2) ෆර්ඩිනන්ඩ් මැගලන් - නව ලෝකය සොයාගැනීම
(3) පේද්‍රෝ අල්වාරේස් කබ්රාල් - බ්‍රසීලය සොයාගැනීම
(4) හර්නැන්ඩෝ කෝර්ටීස් - මෙක්සිකෝව යටත් කිරීම
(5) ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ - පේරු දේශය යටත් කිරීම (……)

**14.** (1) උත්කෘෂ්ට විප්ලවය - ඔලිවර් ක්‍රොම්වෙල්
(2) අමෙරිකානු විප්ලවය - ජෝර්ජ් වොෂිංටන්
(3) රුසියානු විප්ලවය - වී.අයි. ලෙනින්
(4) චීන විප්ලවය - මාඕ සේතුං
(5) කියුබානු විප්ලවය - ෆිඩෙල් කැස්ත්‍රෝ (……)

**15.** (1) ඇඩම් ස්මිත් - ජාතීන්ගේ ධනය
(2) තොමස් පේන් - මිනිස් අයිතිවාසිකම් (Rights of Man)
(3) රබීන්ද්‍රනාත් තාගෝර් - ගීතාංජලී
(4) ජවහර්ලාල් නේරු - ලෝක ඉතිහාසයේ සිහිවටන (Glimpses of World History )
(5) හෝ චි මිං - රජය හා විප්ලවය (State and Revolution) (……)

- අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ. Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) ජෝන් වයික්ලිෆ් | A ජර්මනිය |
| (ii) ජෝන් හස් | B ප්‍රංශය |
| (iii) මාටින් ලූතර් | C ස්විට්සර්ලන්තය |
| (iv) උල්රිච් ස්විංලි | D එංගලන්තය |
| (v) ජෝන් කැල්වින් | E බොහිමියාව |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

**17.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | මුසල් | A | චීනය |
| (ii) | ටොකුගාවා | B | ඉන්දියාව |
| (iii) | මැංචු | C | වියට්නාමය |
| (iv) | න්ගුයෙන් | D | සියම |
| (v) | චක්‍රී | E | ජපානය |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

**18.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | මහජන මන්ත්‍රී මණ්ඩලය | A | රුසියාව |
| (ii) | රයිෂ්ටාග් | B | මහජන චීන සමූහාණ්ඩුව |
| (iii) | ඩූමා | C | ඉන්දියාව |
| (iv) | ලෝක් සභා | D | එංගලන්තය |
| (v) | ජාතික මහජන කොංග්‍රසය | E | ජර්මනිය |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

**19.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | පෙරදිග ඉන්දියා දූපත් | A | ප්‍රංශ |
| (ii) | මලයාව | B | අමෙරිකන් |
| (iii) | ඉන්දු චීනය | C | බෙල්ජියන් |
| (iv) | කොංගෝව | D | බ්‍රිතාන්‍ය |
| (v) | පිලිපීන දූපත් | E | ලන්දේසි |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

**20.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | අමෙරිකානු විප්ලවය | A | "සාමය, ඉඩම් සහ පාන්" |
| (ii) | ප්‍රංශ විප්ලවය | B | "ගොවීන්ට ඉඩම්" සහ "මහා ඉදිරි පිම්ම" |
| (iii) | මෙයිජි ප්‍රතිෂ්ඨාපනය | C | "පොහොසත් රටක්, ශක්තිමත් හමුදාවක්" |
| (iv) | රුසියානු විප්ලවය | D | "නියෝජිතයන් නැතිනම් බදුත් නැත." |
| (v) | චීන විප්ලවය | E | "නිදහස, සමානාත්මතාව, සහෝදරත්වය" |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

**21.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | ආර්ජන්ටිනාව | A | ඇල්ජියර්ස් |
| (ii) | ඊජිප්තුව | B | බුවනෝස් අයර්ස් |
| (iii) | ඇල්ජීරියාව | C | කාටූම් |
| (iv) | සුඩානය | D | ට්‍රිපොලි |
| (v) | ලිබියාව | E | කයිරෝ |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

**22.**

| X | | Y | |
|---|---|---|---|
| (i) | මාරි කියුරි | A | ඉන්දියාවේ පළමුවන කාන්තා අගමැතිනිය |
| (ii) | වැලන්ටිනා තෙරෙශ්කෝවා | B | බ්‍රිතාන්‍යයේ පළමුවන කාන්තා අගමැතිනිය |
| (iii) | ඉන්දිරා ගාන්ධි | C | ඊශ්‍රායලයේ පළමුවන කාන්තා අගමැතිනිය |
| (iv) | ගෝල්ඩා මියර් | D | රේඩියම් සොයාගත් පෝලන්ත විද්‍යාඥවරිය |
| (v) | මාගරට් තැචර් | E | අභ්‍යාවකාශයට පිවිසි ප්‍රථම කාන්තාව |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

**23.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO) | A | නිව්යෝර්ක් |
| (ii) | ලෝක බැංකුව | B | වියනා |
| (iii) | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | C | රෝමය |
| (iv) | ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) | D | වොෂිංටන් |
| (v) | අන්තර්ජාතික න්‍යෂ්ටික බල ඒජන්සිය (IAEA) | E | ජිනීවා |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

**24.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඝානා | A | මිල්ටන් ඔබෝටේ |
| (ii) | ටැන්සානියා | B | කෙනත් කවුන්ඩා |
| (iii) | උගන්ඩා | C | ජෝමෝ කෙන්යාටා |
| (iv) | කෙන්යා | D | ක්වාමේ නිකෘමා |
| (v) | සැම්බියා | E | ජුලියස් නියරේරේ |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

**25.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ට්‍රිග්වි ලී | A | බුරුමය |
| (ii) | ඩැග් හැමර්ෂල් | B | ඔස්ට්‍රියාව |
| (iii) | ඌ තාන් | C | නෝර්වේ |
| (iv) | කුර්ට් වෝල්ඩ්හයිම් | D | පේරු |
| (v) | පෙරෙස් ඩි කුවෙලාර් | E | ස්වීඩන් |

(1) BEACD (2) CEABD (3) DEACB (4) DECAB (5) EDACB (……)

- අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයක ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**26. "අවසාන විනිශ්චය" නම් චිත්‍රය සිතුවම් කළ ශ්‍රේෂ්ඨ කලාකරුවා කවුද?**

(1) මසච්චියෝ (2) බොටිචෙලි
(3) ලෙනාර්ඩෝ ඩා වින්චි (4) මයිකලාංජලෝ (……)
(5) ටිටියන්

**27. සූර්ය කේන්ද්‍රීය විශ්වයක් පිළිබඳ මතය ඉදිරිපත් කරන ලද්දේ කවරකු විසින් ද?**

(1) ටොලමි (2) කොපර්නිකස්
(3) කෙප්ලර් (4) ගැලිලියෝ
(5) නිව්ටන් (……)

**28. ඉන්දියාවේ බ්‍රහ්ම සමාජ් නම් ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ කවරකු විසින් ද?**

(1) රන්ජිත් සිං (2) රාජා රාම් මෝහන් රෝයි
(3) දයානන්ද සරස්වතී (4) බැනර්ජි
(5) බාල් ගංගාධාර් තිලක් (……)

**29. අමෙරිකා එක්සත් ජනපදයේ වහල් ක්‍රමය අහෝසි කරන ලද්දේ කවරකු විසින් ද?**

(1) බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් (2) තොමස් ජෙෆර්සන්
(3) ජේම්ස් මොන්රෝ (4) ඒබ්‍රහම් ලින්කන්
(5) තියඩෝර් රූස්වෙල්ට් (……)

**30. ඉන්දුනීසියාවේ පළමුවන ජනාධිපතිවරයා කවුද?**

(1) කුවේසෝන් (2) අවුං සාන්
(3) තුන්කු අබ්දුල් රහමන් (4) සුහර්තෝ
(5) සුකර්ණෝ (……)

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ......................................... **1** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ......................................... **2** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ......................................... **3** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ......................................... **4** ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ............ **5** ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් නිවැරදිය. |

**31. පෙරදිග පෘතුගීසි අධිරාජ්‍යය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**
(A) පෘතුගීසීහු 1510 දී මලක්කාව අල්ලා ගත්හ.
(B) පෘතුගීසීහු සිය පෙරදිග අධිරාජ්‍යයේ මූලස්ථානය ගෝවෙහි පිහිටවූහ.
(C) පෘතුගීසීහු 1597 දී පිලිපීන දූපත් අල්ලා ගත්හ.
(D) ඇම්බොයිනා ඝාතනයෙන් පසු පෘතුගීසීහු කුළුබඩු දූපත් අල්ලා ගත්හ. (.........)

**32. නිරවි යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**
(A) අමෙරිකා එක්සත් ජනපදයේ හා සෝවියට් දේශයේ නායකත්වයෙන් යුත් බල කඳවුරු දෙක අතර පැවති දෘෂ්ටිවාදීමය, දේශපාලන හා රාජ්‍යතාන්ත්‍රික අරගලයයි.
(B) 1949 දී උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය පිහිටුවීම
(C) 1955 දී වෝර්සෝ සම්මුතිය අත්සන් කිරීම
(D) නිරවි යුද්ධය 1989 දී අවසන් වී යයි සාමාන්‍යයෙන් සැලකේ. (.........)

**33. පහත දැක්වෙන ඒවා අතුරෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන කවරේ ද?**
(A) ජාතීන්ගේ සංගමය
(B) පොදුරාජ්‍ය මණ්ඩලය
(C) මහා සභාව
(D) ආරක්ෂක මණ්ඩලය (.........)

**34. පහත දැක්වෙන්නන් අතුරෙන් සෝවියට් දේශයේ පාලකයෝ කවරහු ද?**
(A) නිකිතා කෘෂෙෆ්
(B) ඇලෙක්සැන්ඩර් සොල්ෂෙනිට්සින්
(C) ලියොනිඩ් බ්‍රෙෂ්නෙෆ්
(D) ආන්ද්‍රෙයි සකරොෆ් (.........)

**35. ඇපාර්තීඩ් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?**
(A) කළු ජාතිකයන් හා සුදු ජාතිකයන් වාර්ගික වශයෙන් වෙන් කර තැබීමේ දකුණු අප්‍රිකානු ප්‍රතිපත්තිය ඇපාර්තීඩ් යනුවෙන් හැඳින්වේ.
(B) අප්‍රිකානුවන්ගේ දේශපාලන අයිතිවාසිකම් අහිමි කෙරිණ.
(C) බ්‍රිතාන්‍යය ඇපාර්තීඩ් ප්‍රතිපත්තියට ආධාර කළේය.
(D) එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇපාර්තීඩ් ප්‍රතිපත්තියට ආධාර කළේය. (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | 1600 දී ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම පිහිටුවන ලදී. | චීන වරායන් බටහිර රටවලට බලෙන්ම විවෘත කරමින් අත්සන් කරන ලද නැන්කිං ගිවිසුමෙන් පළමුවන ඉංග්‍රීසි-චීන යුද්ධය අවසන් විය. | (.........) |
| **37.** | එස්ටේට්ස් ජෙනරාල් සභාව කැඳවීම, අමෙරිකානු විප්ලවය ඇතිවීමට මග පෑදීය. | 1789 සිට 1848 දක්වා විප්ලවීය සමය තුළ චාර්ටිස්ට් ව්‍යාපාරය ප්‍රංශයේ ආරම්භ විය. | (.........) |
| **38.** | ප්‍රංශයන් විසින් බුරුමය යටත් කරගැනීම 1886 දී අවසන් විය. | මොන්කුට් හෙවත් හතරවන රාමා රජු සියමෙහි නවීකරණ ක්‍රියාමාර්ගයක් ආරම්භ කළේය. | (.........) |
| **39.** | දෙවන ලෝක යුද්ධ සමයේ දී ජපානය නැගෙනහිර හා අග්නිදිග ආසියාතික කලාපයේ දැඩි ආක්‍රමණකාරී හා ව්‍යාප්තකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. | පර්ල් වරායට පහර දුන් ජපානය වැඩි කල් නොගොස් පිලිපීන දූපත්, නැගෙනහිර ඉන්දියා දූපත්, මලයාව, සිංගප්පූරුව හා බුරුමය යටත් කර ගත්තේය. | (.........) |
| **40** | බෝල්ටික් මුහුදේ සිට අද්‍රියාතික් මුහුද දක්වා යුරෝපා මහද්වීපය හරහා අයෝමය කඩතුරාවක් වැටී ඇතැයි වින්ස්ටන් චර්චිල් 1946 දී ප්‍රකාශ කළේය. | ජෝශප් ස්ටාලින් පෙරෙස්ත්‍රොයිකා හෙවත් ආර්ථික ප්‍රතිව්‍යුහකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළේය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

ඉතිහාසය II / வரலாறு II / History II — 25-C S

විභාග අංකය / சுட்டெண் / Index No. ..............................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

25-C S II

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

**උපදෙස්:**

✳ **පළමුවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ලෝකයේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) ඇමේසන් ගඟ (ii) ඇපලාචියන් කඳු (iii) බෝල්ටික් මුහුද (iv) බොර්නියෝ
(v) මොස්කව් (vi) බොම්බාය (vii) ඉරානය (viii) කේප් ටවුන්

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගිනි.)*

**2.** (i) පුනරුදය ඇතිවීමට තුඩු දුන් සාධක සැකෙවින් විග්‍රහ කරන්න. (ලකුණු 06 යි)
(ii) පුනරුදය නූතන ඉතිහාසයෙහිලා වැදගත් වන අයුරු විමසන්න. (ලකුණු 08 යි)

**3.** "කාර්මික විප්ලවය යුරෝපයේ ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල මූලික පරිවර්තනයක් ඇති කළේය."
(i) කාර්මික විප්ලවය ආරම්භ වූ රට කුමක් ද? (ලකුණු 01 යි)
(ii) කාර්මික විප්ලවයේ ආරම්භක අවධියේ දී පේෂ කර්මාන්තයට අදාළව නිපදවන ලද යන්ත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(iii) කාර්මික විප්ලවය ඇතිවීමට තුඩු දුන් ප්‍රධාන සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)
(iv) කාර්මික විප්ලවය යුරෝපයේ ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල මූලික පරිවර්තනයක් ඇති කළ ආකාරය එම විප්ලවයේ ප්‍රතිඵල ඇසුරෙන් විමසන්න. (ලකුණු 07 යි)

**4.** "ප්‍රංශ විප්ලවය, සමගාමී විප්ලව මාලාවක් විය."
(i) විප්ලවය ආරම්භ වන විට ප්‍රංශය පාලනය කරමින් සිටි රජතුමා නම් කරන්න. (ලකුණු 01 යි)
(ii) විප්ලවය ඇතිවීමට පෙර ප්‍රංශයේ ජීවත් වූ දාර්ශනිකයන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)
(iii) විප්ලවයට ආසන්න සමයේ ප්‍රංශයේ සිටි විවිධ ප්‍රජා ගණ අතර පැවති දුක්ගැනවිලි සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)
(iv) "ප්‍රංශ විප්ලවය සමගාමී විප්ලව මාලාවක් විය" නමැති ප්‍රකාශය, එම විප්ලවයේ ප්‍රධාන අවස්ථා ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි)

**5.** මෙයිජි ප්‍රතිෂ්ඨාපනයෙන් පසු පළමුවන ලෝක යුද්ධය ආරම්භ වන තෙක් ජපානයේ ඇති වූ දේශපාලන, සමාජ හා ආර්ථික වෙනස්වීම් විස්තර කරන්න. (ලකුණු 14 යි)

**6.** පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩු දුන් හේතු විචාරාත්මකව විමසන්න. (ලකුණු 14 යි)

**7.** "ඉන්දියානු ජාතික නිදහස් සටන, ඉන්දියාව දෙකඩවීමෙන් අවසන් විය." 1935 සිට ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

**8.** වෙකොස්ලොවැකියා අර්බුදයේ අවසානය තෙක් ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය ක්‍රියාත්මක වූ අයුරු විවේචනාත්මකව විමසන්න. (ලකුණු 14 යි)

**9.** **එක්කෝ (A)** කොටසට **නැතහොත් (B)** කොටසට පමණක් පිළිතුරු සපයන්න.

**(A)** (i) චීන කොමියුනිස්ට් විප්ලවය ඇතිවීමට තුඩු දුන් දේශපාලන හා ආර්ථික පසුබිම විග්‍රහ කරන්න. (ලකුණු 08 යි)

(ii) එම විප්ලවයේ සාර්ථකත්වය කෙරෙහි මාඕ සේතුංගේ නායකත්වය කෙතෙක් දුරට හේතු වී දැයි විමසන්න. (ලකුණු 06 යි)

**(B)** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) අමෙරිකානු සිවිල් යුද්ධය

(ii) 1857 ඉන්දියාවේ ඇති වූ කැරැල්ල

(iii) බොල්ෂෙවික් විප්ලවය

(iv) තුෂ්ණි යුද්ධය (එක් කෙටි සටහනකට ලකුණු 07 බැගිනි.)

* * *